

**‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු**



| | | |
|---|---|---|
| **57 වන කාණ්ඩය** | **බු.ව. 2558 නවම් මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2015 පෙබරවාරි මස 03 වන ද** | **10 වන කලබ** |



# නිදහස් රස මිහිර

කුඩා වියේ සිට සිත - කය - වදන
යහපත් ලෙස හැදුවොත් දිවි ගමන
රටට ම ඉන් සැලැසෙයි සෙත නිතින
යහ පාලනයට එය වෙයි අරුණ

මිනිසා නො හදා රට හැදුමක් නැත
සුසිරිත නො පුරා දිවි නැගුමක් නැත
දෑ-කුල බේදය නැති සමඟිය මත
බස -රැස - දෙස නිරතුරු ව නැඟෙනු ඇත

උදම් සිතින් නිදහස් රස මිහිර
නැවුම් ව අපි සැම සදමුව මිතුර
උතුම් සිතුම් පීදේ දී ඉසුර
පියුම් පිපේ රට හැම තැන පැතිර

**- අනඳ**



# ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා

## නිර්භීත තේජවන්ත සමාජ ප්‍රතිශෝධකයාණෝ

ආචාර්ය කේ. අරුණසිරි මහතාණන් විසිනි

අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන්ගේ අභාවයෙන් වසර අසූවක් ගතවී ඇත. වර්තමාන පරපුර විශේෂයෙන් ම යොවුන් පරපුර මෙම නිර්භීත සමාජ ප්‍රතිශෝධකයාණන්ගේ බහු ස්වරූපී සේවාවන් පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් ලබා නොමැති බවක් පෙනේ. මෙබඳු සංක්ෂිප්ත විවරණයක දී එතුමාගේ විවිධ සේවාවන් පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කළ නොහැකි ය. එබැවින් සපුරා අවධාරණය නොකරන ලද නමුත් සමාජමය වශයෙන් වැදගත් වූ සේවාවන් කීපයක් පමණක් සමාලෝචනය කිරීමට බලාපොරොත්තු වෙමි.

ධර්මපාලතුමා එකල සමාජයේ ප්‍රචලිතව පැවති ගර්හිත විදේශීය පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි පුද්ගල නාම භාවිතය කිරීම හෙළාදකිමින් නිර්මල 'ආර්ය සිංහල' පුද්ගලනාම භාවිත කරන මෙන් සිංහල ජනතාව උද්‍යොගිමත් කළේ ය. ඔබ ශතවර්ෂයකට පූර්ව අවධියේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල විසූ සිංහල ජනතාව ගේ පුද්ගල නාම විමර්ශනය කළහොත් ඒ සෑම නාමයක් ම මුලින් සඳහන්

කර ඇති පරිදි යුරෝපීය ප්‍රභවයක් සහිත නාම බව ඔබට පැහැදිළිව පෙනීයනු ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ආර්ය සිංහල පුද්ගලනාම භාවිතයේ වැදගත්කම පිළිබඳව ලාංකේය ජනතාවට ඒත්තු ගැන්වූයේ අනගාරික ධර්මපාල ශ්‍රීමතාණෝ ය. ස්වකීය ජන්ම නාමය වශයෙන් දෙමාපියන් යෙදූ 'ඩේවිඩ්' නම් විදේශීය නාමය බැහැරකොට 'ධර්මපාල' නම් ආර්යසිංහල නාමය ආරූඪ කරගැනීමෙන් මෙම උදාර කාර්යයට ආදර්ශයෙන්ම ආරම්භය ලබා දුන්නේ ය. සත් චේතනාවෙන් ආරම්භ කළ මෙම සද්ව්‍යාපාරය අපූර්ව අයුරින් සාර්ථක විය. ධර්මපාල තුමාගේ ආරාධනය ලාංකේය ජනතාව භක්ති පූර්වකව පිළිගෙන සපුරා අනුකූලතාව ලබා දුන්නේ ය.

ගුණපාල මලලසේකර, පියදාස සිරිසේන ආදී ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයන්ගේ පුද්ගලනාම පවා ධර්මපාලතුමා විසින් යෝජිත නාම බව පැවසේ. මුල් යුගයේ දී ක්‍රිස්තියානි ආගමික නාම ආරූඪ කරගැනීමට ප්‍රවණතාවක් දැක්වූ ක්‍රිස්තුභක්තික සිංහලයන් ද ක්‍රමයෙන් ධර්මපාලතුමාගේ අනුශාසනය පිළිගෙන ආර්ය සිංහල පුද්ගල නාම භාවිතයට අනුගතවීම ප්‍රසාද ජනක පරිවර්තනයක් විය.

ධර්මපාලතුමා ආරම්භ කල මීළඟ සමාජ විපර්යාසය වූයේ සුදුපාට ඇත්තන් එනම් යුරෝපීයයන් ඉදිරියේ සිංහලයන් ප්‍රදර්ශනය කළ බයාදු චර්යාව නිරවද්‍යකොට යහමඟ පෙන්වාදීම ය. සිංහලයන් විදේශීය පාලනය යටතේ ශතවර්ෂ ගණනාවක් ම ජීවත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යුරෝපීයයන් ඉදිරියේ හීනමානසිකත්වයකට අවිඥානකව නම්ම වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. මෙම

මානසිකත්වය වර්තමානයේ ද පවත්නා බවක් මම නො පවසමි. එහෙත් ධර්මපාලතුමා ජීවත් වූ අවධියේ මෙබඳු තත්ත්වයක් පැවති බව එතුමා නිරීක්ෂණය කළේ ය. මෙම මානසික විකෘති තත්ත්වයට විශේෂිත ප්‍රතිකර්මයක් යෝජනා කළේ ය. සුදු මිනිසෙකුගේ ආකෘතියක් නිර්මාණය කොට ස්වකීය නිවසෙහි එල්වා දිනපතා එම පිළිරුවට නිර්භය සේ පහරදෙන මෙන් සිංහල ජනතාවට එතුමා යෝජනා කළේ ය. සුදුමිනිසුන් කෙරෙහි සිංහලයා තුළ පැවති පදනම් විරහිත භීතිය මෙම ප්‍රතිකර්මයෙන් තුරන් වන බව එතුමා පැවසුවේ ය. බ්‍රිතාන්‍ය රජය මෙම උපදේශය කෙරෙහි සැළකිලිමත් වූයේ නැත. වර්තමානයේ මෙවැනි සිද්ධියක් සිදුවූයේ නම් ධර්මපාලතුමා වාර්ගික ද්වේෂය උත්පාදනය කිරීමේ වරදට සිරභාරයට ගනු නියත ය.

විදේශීය සංචාරක ලේඛකයන්ගේ කෘතීන්හි දක්වෙන පරිදි සිංහලයෝ ගවමස් ආහාර වශයෙන් යොදගත් පිරිසක් නො වූහ. ගවමස් භෝජනයෙහි නිරතව සිටි සුළු පිරිසක් වූයේ සමාජයෙන් කොන්කරන ලදුව සිටි එකල සමාජ සම්මතය අනුව කුලහීනයෝ ය. එහෙත් ශතවර්ෂ තුනක් පුරා මුහුදු බඩ පළාත්වල පාලන බලය අත්පත්කරගෙන සිටි විදේශීය රාජ්‍යයන් හා ඔවුන් සමඟ පැමිණි ක්‍රිස්තියානි පූජකවරුන් ගේ බලපෑමෙන් සංකර වූ එම මුහුදුබඩ ප්‍රදේශවල ජනයා ගවමස් භෝජනයට ඇබ්බැහි වූහ.

ධර්මපාලතුමා මෙම ප්‍රවණතාවට බලවත් සේ විරෝධය පළකළේ ය. එතුමාගේ ප්‍රචාරක පාඨ වූයේ ''සිංහලයිනි ගෙරිමස් නොකව්'' ''ගෙරිමස් බුදින්නා වසලයෙකි'' ආදී වදන් ය. එතුමා ගේ චාරිකාවන්හි දී මෙම පණිවුඩය හඬගා පැවසුවේ ය.

ධර්මපාලතුමා අප දේශයෙන් තුරන් කිරීමට මුලිනුපුටා දැමීමට වැර දැරූ සමාජ ව්‍යසනය වූයේ ජනයාගේ මද්‍යලෝලිත්වය ය. මෙම පුරුද්ද ද විදේශික බලපෑම හේතුකොටගෙන එකල උසස් ධනවත් සමාජයේ ජනප්‍රිය සමාජ විලාසිතාවක් බවට පත් වී තිබිණ. සමාජයේ සෑම කල්හිම සාමාන්‍ය ජනතාව ද ප්‍රභූන්ගේ සමාජ විලාසිතා අනුකරණය කිරීම සුලභ ප්‍රවණතාවක් වන බැවින් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජනතාව ද මත්පැන් බීමට ඇබ්බැහි වීමෙන් පිරිහීමට පත්ව සිටියහ. මත්පැන් නිෂ්පාදනය හා අලෙවිය රජයට අයබදු ලබාගැනීමේ පහසු මාර්ගයක් වූ බැවින් මද්‍යසාර නිෂ්පාදනයට එකල පැවති විදේශීය යටත් විජිත පාලනයේ අනුග්‍රහය ද නොමඳව ලැබිණ. යටත් විජිත පාලනය වැඩි වැඩියෙන් ''තැබෑරුම්'' නොහොත් සුරාවෙළෙඳ සල් විවෘත කිරීමට සහාය විය. ධර්මපාලතුමා මේ ප්‍රශ්නය මුල්කොට රජය සමඟ ගැටුම් ඇතිකර ගැනීමට යොමු වූයේ නැත. එතුමාගේ ක්‍රමවේදය වූයේ ජනතාවට අනුශාසනය කොට මෙම ව්‍යසනයෙන් මුදවා ගැනීම ය. මෙම ක්‍රමවේදයෙන් එතුමාගේ අභිමතාර්ථය සුළු ප්‍රමාණයකින් සාර්ථක විය.

ධර්මපාලතුමා අඛණ්ඩව මහත් කැපවීමෙන් සිංහල බෞද්ධ ජනතාවගේ අභිවෘද්ධිය හා සුරක්ෂිතභාවය ශක්තිමත් කිරීමට උත්සුක විය. අනෙක් වාර්ගිකයන් ගෙන් එතුමාට ප්‍රශ්න ඇති නොවී ය. එකල ලංකාවේ රාජ්‍ය පාලනය මෙන් ම ආර්ථිකය ද විජාතිකයන් ගේ පාලනයේ පවත්නා බව ජනතාවට හෙළි කළේ ය. එහෙත් ඔවුන් සමඟ සටන් වැදීමට ජනතාව පෙළඹවූයේ නැත. කුසීත

නොවී අකර්මණ්‍ය නොවී වීර්යවන්තව ස්වකීය කාර්යයන් ඉටුකරගෙන ජීවිතයේ සාර්ථකත්වය සාක්ෂාත් කරගැනීමට ජනතාව උනන්දු කළේ ය. සිංහලයන්ගේ කුසීත බව හා අනුද්‍යෝගය එතුමා නිර්දය ලෙස හෙළා දැක්කේ ය.

ජනතාවගේ දුර්වලතාවන් පෙන්වාදීමේ දී එතුමා ඇතැම්විට කර්කශ විය. එතුමාගේ විවේචන දරුණු විය. එතුමා ප්‍රසිද්ධ රැස්වීම්වල දී එකල ජනප්‍රියව පැවති ''නැම්පනාව'' ආදී නොමනා විලාසිතා අනුකරණය කළ පුද්ගලයනට ප්‍රසිද්ධියේ පරිහාස කළේ ය. ජාතියේ හා ආගමේ අගෞරවයට පටහැනිව ක්‍රියාකළ පුද්ගලයනට එතුමා අනුකම්පා විරහිතව දෝෂාරෝපණය කළේ ය. එහෙත් මේ සියල්ල අභිමුඛයෙහි අතිශයින් විස්මය ජනක දර්ශනය වූයේ ජනතාව එතුමාගේ නිර්දය වාග් ප්‍රහාරයන් ඉවසමින් කිසිදු විරෝධී ප්‍රතිචාරයක් නොදැක්වීම ය. එතුමාගේ සියලු විවේචනයන් ප්‍රහාරයන් ජාතියේ හා ආගමේ ශුභසිද්ධිය උදෙසා ජනිත වූ අවංක හෘදයංගම ආකල්පයන් බව ජනතාව මනාව අවබෝධ කොටගෙන සිටි නිසා ය.

1948 දී ලංකාව ස්වාධීනත්වය ලබාගැනීමට අවශ්‍ය පසුබිම සකස් කරන ලද්දේ ද අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන් විසිනි. මෙම යථාර්ථය නිසි අයුරින් පිළිගෙන ඇති බවක් නොපෙනේ.

**සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා !**



# නිදහසේ නිදහස

**සිරි වජිරාරාම දහම් පාසලේ නියෝජ්‍ය ප්‍රධානාචාර්ය ශාස්ත්‍රවේදී**
**පූජ්‍ය මීගොඩ සුබිත හිමිපාණන් විසිනි**

උදුවන්නේ ශ්‍රී ලංකාවේ 67 වන නිදහස් දිනය යි. නිදහස කියූ සැණින් අපට සිහිවන ලකුණු ඇත. ජාතික කොඩිය, ජාතික ගීය, නිදහස් මන්දිරය, ඩී.එස්. සේනානායක පිළිරුව, විරු ගී ආදිය යි. 1948 දී අප රට ලැබූ නිදහස පිළිබඳ ව ඊට එහා අරුතක් විමසා බැලීම වටී.

නිදහස පතා දෑ විරුවන් අරගල කළේ අද ඊයේ සිට නොවේ. ක්‍රි.පූ. 03 සියවසේ දී එල්ල වූ සේන-ගුත්තික ආක්‍රමණයේ පටන් එළාර, සත් ද්‍රවිඩ, ශ්‍රී මාර ශ්‍රී වල්ලභ, 1 රාජ රාජ, වීර රාජේන්ද්‍ර චෝල, කාලිංග මාඝ ආක්‍රමණ දක්වා ද පෘතුගීසි, ලන්දේසි ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් සමඟ ද ඉතිහාසය පුරාම නොනිමි අරගලයක අපි යෙදී සිටියෙමු. ඒ මේ භූමියත් මේ භූමියෙහි සදාතනික උරුමයක් ව රැකෙන ශ්‍රී සද්ධර්මයත් වෙනුවෙනි.

සිංහලයන් ඉංග්‍රීසින්ට විරුද්ධව අරගලය අරඹනුයේ 1815 මාර්තුවේ අඳුරු දිනක මේ පුණ්‍යවන්ත දේශය ඉංග්‍රීසි කොඩියට යටත් කර ගැනීමටත් පෙර සිට ය. එනම් 1802

දී ඉහගම රතනපාල හිමියන්ගේ මූලිකත්වයෙනි. එදා පටන් ජාතික සටන වෙනුවෙන් අරගල කළෝ අපමණ ය. ඉතිහාසයේ අරුණෝදයේ දී ම හමුවන සේන-ගුත්තික දෙබෑයන්ට එරෙහිව දිවි පුදකළවුන්ගේ ලේ දහරාවල පටන් සිවුසාළිස් වසක් පුරා දෑයේ හදවත අරක්ගෙන සිටි නපුරු එළාර පලවා හරින්නට කළ සිංහලයේ අසම සම විමුක්ති අරගලයේ හෙළූ ලේ දහරා දක්වා ද ඉන් පසු යුග යුග ගණන් ද විරුවන්ගේ ලෙයින් මේ පොළොව සාර විය.

ඒ සාර භූමිය යළි යළිදු සාර කරමින් 1815 පටන් කුඩාපොළ හාමුදුරුවන්ගේ කැප්පෙටිපොළ මහ නිළමේතුමන්ගේ, ඇල්ලෙපොළ නිළමේතුමන්ගේ විල්බාවේ රටේ රාළගේ, මද්දුම බණ්ඩාරගේ, පුරන් අප්පුගේ, ගොන්ගාලේගොඩ බණ්ඩාගේ, ඇප්, ආර්, සේනානායක, හෙන්රි පේදිරිස් ඈ තවත් ඉතිහාසය විසින් නම් කී නොකී බොහෝ විරුවන් ගේ දෑ ලේ දහරින් මේ පොළොව සාර විය. ඒ සටන් කෙළවර 1948 දී දිනූ නිදහස අපට අනුකම්පාවෙන් ආදරයෙන් පිළිගැන්වූ එකකැයි අයෙකුට සිතුණ ද ඒ නිදහස පුරා සිය ආත්මාර්ථය, පරාර්ථය වෙනුවෙන් හළ මහා මිනිසුන්ගේ ජීවන සුවඳ කැවී තිබිණි.

කගපතින් මතු නොව මතවාදීව නිදහස් අරගලයට කැපවීම් කළෝ බොහෝ ය. ශ්‍රීමත් අනගාරික ධර්මපාල උතුමාණෝ ගම් නියම්ගම් දෙර දෙර සිසාරා සිංහනාද කරමින් නිදහස් සටනට පණ පෙවූ හ. කුමරතුඟුවෝ කගපතටත් වඩා පන්හිඳ බලවත් බව ශපථ කරමින්

නිදහස් නොවහල් සුබැසි දෑයක් පතා සටන් වැදුණෝ ය. එස්. මහින්ද හාමුදුරුවෝ කවියෙන් මේ උතුම් නිදහස් සටනට පණ පෙවූ හ.

සිය සුවය ලෝකයාගේ සුවය පතා අත්හරින්නෝ මහ බෝසත්වරු ය. මහ බෝසත්වරු සිය ආත්මසුවය පවා අත්හරිමින් ලෝසතුන් වෙත පතළ මහා කරුණාවෙන් ඝෝර භයංකර සසරට වදිති. මේ පුදුම සහගත මිනිස්සු ද ඔවුනොවුන්ගේ සාංසාරික විමුක්තිය පසෙකලා දෑයත් සසුනත් වෙනුවෙන් අරගල කළෝ ය. ඔවුහු බෝසත්වරු නොවන්නාහු ද? ඒ බෝසත් මිනිසුන්ට පින් සිදුවන්නට අපි නිදහස ලැබූයෙමු. එහෙත් ඒ අපූරු මිනිසුන් ගේ ප්‍රාර්ථනාව අප ඉටු නොකළහොත් අපට ශාපවනු ඇත. ඉතිහාසය නමැති ජූරිය ඉදිරියේ අප වරදකරුවන් වනු ඇත.

ඔවුන් පැතුවේ හුදු පිටතින් පමණක් නිදහස් වූ දෑයක් නොවේ. සිතුමින්, සිරිතින්, දෙසින්, බසින් රැසින් ඈ හැම ලෙසින් ම නිදහස් වූ නොවහල් වූ දෑයක් ය. එහෙත් අපි ඒ පැතුම් පරිදි පිරිපුන් නොවහල් වූවෝ ද යි යළි යළි සිතිය යුතු ම ය. පෙබරවාරි 04 වන දට ජාතික කොඩියක් ඔසවා, දෑ ගී ගයා, විරු ගී ගයා, රැඟුමින් වැයුමින් අපි නිදහස්යැයි දහස්වර කියූවත් බසින් අපි කොතරම් වහල්ලු ද යි, සිතුමින් හා සිරිතින් අපි කොතරම් වහල්ලු ද, අහරින් පවා අපි කොතරම් වහල්ලු ද යි සිතනු මැනවි.

දැන් අපට අවි අමෝරාගෙන සටන්වදින්නට යුද අරගලයක් නැත. දැන් අපට ඇත්තේ චින්තනමය හා

ආකල්පමය අරගලයකි. සතුන් මර මරා පැකට් කරමින්, ගස් කප කපා විකුණමින්, මිනිසුන් මරා පියා දේශ දේශාන්තර අල්ලමින්, මත් වතුර පෙර පෙරා බෝතල් කරමින්, අවි ආයුධ තන තනා නැව්ගත කරමින්, අහර යැයි කිය කියා වස විස කවමින්, අම්මාවරුන් ගේ ඇඟ මස මහ මඟ විකුණමින්, දුබස ම සුබස කරමින්, අධර්මය ම ධර්මය කොට ගනිමින්, අපිදු ධනවත්තු යැයි, අපිදු දියුණු යැයි කියන ලෝකයට වෛරය වෙනුවට මෛත්‍රිය ඉගැන්වීමේ අරගලය යි. හිංසාව වෙනුවට අවිහිංසාව ඉගැන්වීමේ අරගලය යි. මිනිසුන්ට මනුෂ්‍යත්වය ඉගැන්වීමේ අරගලය යි. කාමය වෙනුවට විරාගය ඉගැන්වීමේ අරගලය යි. දුබස වෙනුවට සුබැසි හද බස ඉගැන්වීමේ අරගලය යි. ගහක කොළක සෙවණ, ඇළක දෙළක සිසිල කියාදීමේ අරගලය යි. බොහෝ දෑ පතන පරම්පරාවට ලද දෑයින් තුටු වූ මිනිසුන් ගේ කතාව කියා දීමේ අරගලය යි.

අපරිමිත බෝසත් ගුණැති මිනිසුන් නිදහස පතා දිවි දුන්නේ ධර්මයත් ධර්මය රකින මේ බිමත් රැක්මට ම ය. දැන් අප ඒ විරුවන් රැක දුන් දහම ජීවිතය කර ගත යුතු නොවේ ද?



# රාහුල චරිතයෙන් හෙළිවෙන දැහැමි සමාජයක ගමන් මඟ

අධිකරණ අමාත්‍ය
ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා විසිනි

බෞද්ධ දර්ශනය ව්‍යවහාරමය ලෙස බුද්ධාගම යැයි සඳහන් කරනු ලැබුව ද එය කිසිසේත් ම ආගමක් හෝ ඇදහිල්ලක් නොවේ. එය තුළ නිර්මාණවාදයක් හෝ නිර්මාපකයෙක් නොමැත. බුදුන් වහන්සේ නිර්මාණවාදියෙක් ද නොවෙති. උන්වහන්සේ ලොවෙහි පවතින යථාර්ථය ගුරු උපදෙස් නොමැතිව ස්වකීය ධෛර්යයෙන් හා ඥානයෙන් අවබෝධකරගත් ශාස්තෘන් වහන්සේ නමකි. උන්වහන්සේ ගේ ඉගැන්වීම් මාර්ග ඵල ලබා අර්හත්වය පතන භික්ෂු භික්ෂුණීන්ට සීමා නොවූ අතර ලෝකෝත්තර සුවය උදෙසා අනුගමනය කළ යුතු මාර්ගයක් ලෙසට ද සීමා නොවුණි. පූර්ව කර්ම ඵල හේතුවෙන් උසස් මනසක් ඇති ව ඉපදෙන මනුෂ්‍යයන්ට ලෞකික ලෝකය පිළිබඳ අවබෝධයක් ලබාගත නොහැකි නම් ලෝකෝත්තර සුවයක් ගැන කල්පනා කිරීම හුදු මිථ්‍යාවකි. බෞද්ධ දර්ශනය භික්ෂු භික්ෂුණීන්ට මෙන්ම උපාසක උපාසිකාවන්ට ද එක හා සමාන ලෙස ප්‍රයෝජනවත් වෙයි.

මෙලොව ජීවත්වන මිනිසා ශිෂ්ට සම්පන්න මානව දයාවෙන් පිරිපුන් අයකු ලෙස ජීවත්වීමේ වැදගත්කම බුදුන්

වහන්සේ පහළවීමට පෙර පවා මානව ශිෂ්ටාචාරයන් තුළ දක්නට ලැබුණි. එහෙත් ගිහි ජීවිත ගත කරන්නන් ලෞකික, ලෝකෝත්තර අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ජීවිත හැඩ ගස්වා ගත යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ බුදුන් වහන්සේ තරම් නිවැරැදි ක්‍රමෝපායයන් හඳුන්වා දුන් වෙනත් ශාස්තෘවරයෙක් මෙලොව පහළවී නොමැත්තේ ය.

ගිහියන් සිය ජීවිකාව පවත්වාගෙන යාමේදී සමාජයේ අන් ජනතාව සමඟ පවත්වාගෙන යා යුතු අන්‍යොන්‍ය සබඳකම්වල ස්වභාවයන් සහ ක්‍රමවේදයන් පිළිබඳ දේශනා කර ඇති අවස්ථාවන් අනන්ත ය. ශිෂ්ට සම්පන්න සමාජයක් තුළ මවුපිය දූදරු, ස්වාමි භාර්යා, ගුරු සිසු, සේව්‍ය සේවක, ගිහි පැවිදි සහ මිත්‍ර සම්බන්ධතා විධිමත් ලෙස පවත්වාගෙන යා යුතු ආකාරය සිගාලෝවාද සූත්‍රයේ තරම් සාර්ථක ලෙස වෙන කුමන ශාස්තෘවරයකු විසින් හෝ දේශනා කර නොමැත. බුදුන් කල මහා භාරතයේ රජ පවුලේ සිට කුලහීන දිළිඳු පවුල දක්වා සමාජයේ අන්‍යොන්‍ය සම්බන්ධතාවක් ඒ ඒ සමාජ කොට්ඨාසවලට ආවේණික වූ පරිද්දෙන් පැවතුණ බවට භාරත ඉතිහාසයේ ඓතිහාසික සාධක කොතෙකුත් දකින්නට ඇත. ඒවා බුදුන් වහන්සේ විසින් හුදු දේශනාවකට සීමා නොකොට ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කොට පෙන්වා ඇති බව සක්සුදක් සේ පැහැදිලි ය. එනිසාම උන්වහන්සේ ''තථාවාදී තථාකාරි, යථාකාරී තථාවාදී'' ලෙස හඳුන්වා ඇත. උන්වහන්සේ ඉදිරිපත් කළ දේශනාවන් තථ්‍ය ලෙසින් අවබෝධ කර ගත්තා පමණක් නොව සත්‍ය ලෙසින් උන්වහන්සේ ද අනුගමනය කළහ. උන්වහන්සේ ගේ එකී ගුණයන් පිළිබඳව දීඝ නිකායේ පාථික වග්ගයේ උදුම්බරික සූත්‍රයේ මෙසේ සඳහන් වේ.

බුද්ධෝ සො භගවා බෝධාය ධම්මං දේසේති. ( එනම් තමන් විසින් අවබෝධ කර ගැනීමෙන් පසු එසේ අවබෝධ කරගත් ධර්මය අන් අයට අවබෝධ කරවනු පිණිස දේශනා කිරීම)

**සන්තෝ සෝ භගවා සමථාය ධම්මං දේසේති.** (තමන් ශාන්ත භාවයට පත්ව අන් අය ද ශාන්ත භාවයට පත් කරවීම පිණිස ධර්මය දේශනා කිරීම)

**දන්තෝ සෝ භගවා දමථාය ධම්මං දේසේති** (තමන් දමනය වී අන් අය ද දමනය කිරීම පිණිස ධර්මය දේශනා කිරීම)

**තිණ්ණෝ සො භගවා තරණාය ධම්මං දේසේති.** (තමන් විසින් සංසාර සාගරය භවයෙන් එතෙර වී අන් අය ද ඉන් එතෙර කරවීම පිණිස දේශනා කිරීම)

**පරිනිබ්බුතෝ සෝ භගවා පරිනිබ්බාය ධම්මං දේසේති.** (තමන් කෙලෙස් ප්‍රහාණය කර අන් අයට ද කෙලෙස් ප්‍රහාණය කරවීම පිණිස ධර්මය දේශනා කිරීම)

බුදුන් වහන්සේ සියලු කෙලෙස් ප්‍රහාණය කර තුන් ලොවට ම උත්තරීතර වුවත්, සියලු බැඳීම්වලින් තොර වුවත් සියලු ලෝකවාසී ජනතාව කෙරෙහි තිබූ අප්‍රමාණ කරුණාව සහ දයාව පදනම් කොට ගෙන සිය පියාට, මවට, පුතුට සහ ඥාතීන්ට යුතුකම් ඉටු කළහ. උන්වහන්සේ බුද්ධත්වයට පත්ව සත්වන වස් කාලයේ දී තව්තිසා දෙව් ලොවට වැඩම කොට සිය මවුතුමිය සසර කතරින් එගොඩ කරනු වස් ධර්මය දේශනා කළහ. සිය පියා වූ සුද්ධොදන මහ රජතුමා හට ධර්ම දේශනා ගණනාවක් සිදු කොට අනාගාමි ඵලයට පත් කරවන ලදි. සුද්ධොදන මහරජ රහත් ඵලය ලබා රජකු

ලෙසට පරිනිර්වාණයට පත්විය. ගිහි කල සිය බිරිඳ වූ යසෝදරාවට භික්ෂුණීභාවය ලබාදී මාර්ගඵල ලබා ගැනීමේ අවස්ථාව ලබාදීමට කටයුතු කළහ. උන්වහන්සේ ගිහි කල රැක බලාගත් මහා ප්‍රජාපතී ගෝතමිය ද සසර කතරින් එතෙර කරවූහ. සිය පුත් රාහුල සහෝදර නන්ද යනාදීන් ඇතුළු, ආනන්ද, භද්දිය, භගු, කිම්බිල ආදී විශාල ශාක්‍ය පිරිසක් හට මහණදම් පිරීමට අවස්ථාව සලසා මාර්ගඵල ලබා ගැනීමට අවස්ථාව උදාකර දුන්හ.

බුදුන් වහන්සේ සිය පුත් රාහුල හිමියන්ට දුන් අවවාද අද කාලයේ දී ද සිහිපත් කිරීම සමාජයට මහත් සේ ප්‍රයෝජනවත් ය. රාහුල, ආහාරය පමණ දැන වළඳන්න. චීවර, පිණ්ඩපාත. සේනාසන, ගිලානප්‍රත්‍ය යන සිව්පසට ගිජු නොවන්න. පමණ දැන කටයුතු කරන්න. ඉන්ද්‍රිය සංවරය ඇතිකර ගන්න යනාදී ලෙස අවවාද ලබා දෙමින් මෙලොව පරලොව සුභ සිද්ධිය අර්ථ සාධනය සඳහා කටයුතු කරන ලදී. මනෝරථපූරණී ඒකක නිපාත වර්ණනාවේ සඳහන් පරිදි කිසියම් කෙනෙකුගෙන් අවවාදයක් ලබා ගැනීමට රාහුල හිමියන් මහත් රුචියක් දක්වා ඇත. උදයේ නැගිට වැලි දෝතක් අහසට විසි කොට භාග්‍යවතුන් වහන්සේගෙන් ද උපාධ්‍යායන් වහන්සේලාගෙන් ද අවවාද ලැබේවායි ප්‍රාර්ථනා කිරීම පුරුද්දක් කොට ගෙන තිබුණි.

ශාක්‍ය පරම්පරාවේ ඔටුන්න හිමි කුමරු ලෙස උපත ලබා භික්ෂුත්වයට පත් වූ රාහුල හිමියන් ගේ ඉවසීමේ ගුණය තිපල්ලත්ථමිග ජාතකයෙන් මොනවට පැහැදිලි වෙයි. උන්වහන්සේ මිදුල අතුගෑ පසු වෙනත් අයකු විසින් එම මිදුල කොළ රොඩු දමා අපවිත්‍ර කරන ලදි. ඒ පිළිබඳව උපාධ්‍යායන් වහන්සේ ප්‍රශ්න කළ විට අනෙක් භික්ෂූන්

වහන්සේලා විසින් එය රාහුල හිමියන් විසින් කරන ලද බවට අසත්‍ය කරුණු පැවැසූහ. ඒ පිළිබඳව රාහුල හිමියන්ගෙන් ප්‍රශ්න කළ විට උන්වහන්සේ පිළිතුර දුන්නේ උන්වහන්සේ එසේ නොකළ නමුත් නොකළ වරදට වුව ද සමාව ඉල්ලා එම මිදුල නැවත පිරිසුදු කරන බවයි.

පාචිත්තිය පාලියේ සඳහන් ආකාරයට බුදුන් වහන්සේ කොසඹෑ නුවර හදිරිකාරාමයෙ වැඩ වෙසෙන සමයේ එක් දිනක් රාහුල හිමියන් එම ආරාමයට පැමිණ ඇත. එහි තිබූ සියලු කුටිවල භික්ෂුන් වහන්සේලා වැඩ සිටි හෙයින් උන්වහන්සේ එදින බුදුන් වහන්සේ සඳහා වූ වැසිකිළියේ රාත්‍රිය ගත කරන්නට යෙදී ඇත. පසුදින උදෑසන එය දුටු බුදුන් වහන්සේ ශාරිපුත්‍ර තෙරුන් වහන්සේ කැඳවා ශාරිපුත්‍රයිනි, ඊයේ රාත්‍රියේ රාහුල සැතපුණේ කොහිද? යන්න ප්‍රශ්න කළහ. එවිට සැරියුත් තෙරන් ඒ පිළිබඳව නොදන්නා බව පැවසූහ. එවිට බුදුන් වහන්සේ ''ශාරිපුත්‍රයිනි, එසේ නම් දැන ගන්න, ඊයේ රාත්‍රියේ රාහුල සැතපුණේ මගේ වැසිකිළිය තුළයි. මේ ලෙස රාහුල හැර දමන නුඹලා අනෙක් කුල දරුවන් පැවිදි කොට කුමක් කරයි ද? ශාරිපුත්‍රයිනි තවදුරටත් මෙවැනි දේවල් සිදුවුව හොත් මාගේ මේ ශාසනයේ පැවිදි බව ලබාගන්නා වූ කුල දරුවන්ට කාගේ පිහිටක් ද? යනුවෙන් දේශනා කළ සේක.

එම සිද්ධිය දෙස බැලීමේදී බුදුන් වහන්සේගේ පමණක් නොව රාහුල හිමියන්ගේ ඉවසීමේ ගුණය කෙබන්දක් ද යන්න මනා ලෙස වටහාගත හැකි ය.

රාහුල හිමියන් වරක් සිය මව වූ යසෝදරා භික්ෂුණීන් වහන්සේ බැහැදැකීමට ගිය අවස්ථාවක දක ගැනීමට හැකිවූයේ එම භික්ෂුණීන් වහන්සේට උදරාබාධයක් සැදී

ගිලන් බවට පත්ව සිටි බවයි. ඒ සඳහා කුමන ඖෂධයක් සුදුසුදැයි විචාල කල්හි මීට පෙර ගිහි කල එවැනි ම ගිලන් භාවයක් ඇති වූ අවස්ථාවේ දී මී අඹ සහ හකුරු වැළඳූ විට එය සුවපත් වූ බව ප්‍රකාශ කරන්නට විය. අනතුරුව රාහුල හිමියන් තම උපාධ්‍යායන් වහන්සේ වූ සැරියුත් තෙරුන් ද සමඟ කොසොල් රජතුමාගේ මාලිගයට පිඬුසිඟා වැඩිවිට මී අඹ සහ හකුරු පිළිගන්වන ලද අතර ඒවා සිය මවට පිළිගන්වා උදරාබාධය සුව කරවා ගැනීමට උපකාර කළහ.

ඉහත කී ආදර්ශයන් පැවිදි සමාජය තුළ පමණක් නොව ගිහි සමාජය තුළ ද ඒ ආකාරයෙන් ම පැවතිය යුතු ඒවා ය. රටේ ඉහළ තනතුරු හොබවන පාලකයන්ගේ පවුල් තුළ පමණක් නොව දිලින්දන්ගේ පවුල් තුළ ද එවන් වූ දැහැමි ගුණාංග පැවතිය යුතු අතර ඒවා නොමැති කල සමාජය තුළ පවතින පවුල් ඒකකයන් පමණක් නොව මුළු මහත් රටේම සමාජයේ ම පවතින හර පද්ධතීන් බිඳ වැටෙමින් අරාජික තත්ත්වයට පත්වනු ඇත. වර්තමානයේ වුව ද පාලකයන්ගේ සහ බලවතුන්ගේ දූ දරුවන්ගේ සුභ සිද්ධිය සැලසෙනුයේ පුහු මානය සහ බලය තර කිරීම මගින් නොව ධාර්මික ලෙස ජීවිතය හැඩ ගස්වා ගැනීමට කටයුතු කළහොත් පමණි. ඒ සඳහා බෞද්ධ දර්ශනයේ සඳහන් මාර්ගය හැර අන් කිසිදු දර්ශනයක් හෝ ඇදහීමක් උපකාරී නොවනු ඇත.





# රටට පිහිට හොඳ දරුවෝ


**පුෂ්පා ජයවර්ධන මහාත්මනිය**

ලේඛිකා - සිරි වජිරාරාම සාසන සාවිකා සමිතිය


උදයම පිබිදෙන දරුවෝ
පාඩම් කරනට සුරුවෝ
පින් සිතුවිලි සිත් දැරුවෝ
ඔබ මැ යි යහපත් දරුවෝ

මල්දම් මෙන් නෙක රුවැති
සුවඳැති නෙක පැහැ ගුණැති
සමගිව එකිනෙක බැඳෙති
ලොවට ම මිහිරක් ගෙනෙති

හෙළ බස හෙළ දැයට ලැදී
මෙත් සිතුවිලි හදෙහි රැඳී
සුරකින පන්සිල් සිත දී
දරුවෝ වැජඹෙති සුව

සිහින් සිනා මුවෙහි විද
එඩිතර ගති ළයෙහි රඳා
මෙත යහපත සතුට බෙදු
වොරදන ඔබ රජෙකි මෙදු

ගාමිණි පැරකුම් විරුවෝ
එ බඳු උතුම් ගුණ දරුවෝ
දැය සරසන දූ-දරුවෝ
සිරි ලක් බිම හිමි කරුවෝ



# කට රැක ගනිමු

විශ්‍රාමලත් ආචාර්යාණී
ලක්ෂ්මි කරුණානායක මහාත්මිය විසිනි

එක් නිවාඩුවක් ගත කිරීමට අයියාත් නංගීත් අනුරාධපුර මාමලාගේ ගෙදර ගියහ. උදෑසන අවදි වූ ඔවුහු අවට සිරි නරඹන්නට වූහ. නිල් මානෙල් මලින් පිරුණු පොකුණක් දුටු නංගී සමනලියක් මෙන් දෑත් විදහා ගෙන කවියක් ගායනා කරමින් ඒ දෙසට ඇදුණා ය.

මානෙල් සුවඳ ම ය - කුඩ මසු පිළී ගඳ ම ය
දෙකට එක දිය ම ය - හොඳට නරකට දෙකට කට ම ය

නංගී සමඟ පොකුණ දෙසට ගිය අයියා, නංගී දන්නවා ද ඔය කවියේ අදහස?

සුවඳ හමන මානෙල් මලුයි පිළී ගඳ හමන කුඩා සතුනුයි හැදෙන්නේ වතුරේ. ඒ වගේ අපේ කටින් හොඳ නරක දෙකම කරන්න පුළුවන්.

''නංගී, හරියට හරි'' අයියා සතුටින් කීවේ ය. ''ඒ වුණාට අයියේ, හොඳයි, නරකයි දෙක ම කටින් කරන්නේ කොහොම ද?''

''නංගී, මේ කටින් කරන්න පුළුවන් බොහොමයක් දේ තියනවා. දස අකුසල්වලින් හතරක් ම සිදුවෙන්නේ වචනයෙන්. කටින් කතා කරන්න පුළුවන්. රස බලන්න පුළුවන්. හැඟීම් අදහස් පළකරන්න පුළුවන්. ඒ වුණාට ඒවා කරන්න ඕන හරිම පරෙස්සමෙන්.

''රට වට කර වැට බැන්දත් කට වට කර වැට බඳින්න බැහැ''

''පිට කළ වචනයක් ඇතුන් ලවා වත් අද්දවගන්න බැහැ''

වැනි ප්‍රස්තා පිරුළු පවා හැදිලා තියෙනවා.

වචනවලින් සමාජයක් රටක් විනාශ කරන්නත් පුළුවන් හදන්නත් පුළුවන්, නංගී අපේ බුදුහාමුදුරුවෝ ධර්මය දේශනා කරලා සමාජයට රටට මුළු ලොවට යහපත සිදු කළා. උන් වහන්සේ පිරිනිවන් පාලා අවුරුදු 2500 වැඩි වුණත් අද දක්වා ම ඒ දහම ලොව බබළවනවා.

නංගී කටින් පිට කරන හොඳ නරක වචනවලින් සිත් පිරිසිදුවීම අපිරිසිදුවීම සිදුවෙනවා. කටින් ඇතුළු කරන හොඳ නරක කෑම-බීමවලින් අපේ කය නිරෝගී වීම, රෝගී වීම සිදුවෙනවා.

කටින් කය නිරෝගී කර ගන්නත් ලෙඩ කර ගන්නත් පුළුවන්.

කේලමෙන් බොරුවෙන් හිස් වචනයෙන් පරුෂ වචනයෙන් වැළකී අපි අපේ සිත් පිරිසිදු කර ගනිමු.

රසකාරක යෙදූ ආහාරයෙන් හා මත් ද්‍රව්‍යවලින් දුරු වී කය නිරෝගී කර ගනිමු.

සිත කය දෙකම පිරිසිදු කර ගැනීමට නම් අපි කට රැක ගතයුතු වෙමු.

කටින් පිටවන දේ ගැනත් ඇතුළු කරන දේ ගැනත් අපි නිතර ම සම්මා සතියෙන් බැලිය යුතු වෙමු.

''කන්නට දෙඩන්නට
පමණක් කට තිබේ යැ යි
කටටා'වක් නො විමසා
නො ම කියයි නුවණැත්තේ''

- **(පැළෑණේ සිරි වජිරඤාණ මහනාහිමි)**

When awareness becomes natural, the mind is strong and the wisdom you have acquired is always available. You no longer need to make an effort to bring it in. When the observing mind gets stronger, wisdom can deal more competently with defilements. As your wisdom grows, the mind becomes purer and more equanimous. Eventually you will start experiencing moments of equanimity and clarity in which you begin to see things in a completely new light. In other words, you start having insights.

From ***Don't Look Down On The Defilements***
By ***Ashin Tejaniya***



# වෙළුක ජාතකය

විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණී
ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි

ලොව්තුරා අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන කල, අවවාද නොපිළිපදින එක් භික්ෂුවක් අරභය මෙම ජාතකය වදාළ සේක. එම භික්ෂුව දෙව්රම් වෙහෙර වැසි හිමිවරුන්ගේ කතිකාවට බඳුන් විය. මෙම ප්‍රශ්නය අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ වෙත භික්ෂුහු සැළ කළ පසු

''මහණ, මෙවැනි තමන්ගේ මතය අනුවම ක්‍රියා කරන ගිහියන් පමණක් නොව භික්ෂු මෙකල මෙන් ඈත අතීතයේ දී වාසය කළ බව දන්නෙහි දැ'යි භික්ෂූන්ගෙන් අසා අතීත කථාව වදාළ සේක.

පෙර කල බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු කෙනෙකුන් ගේ පාලනය සමයෙහි ද අප මහ බෝසතාණන් වහන්සේ සෑම සම්පතකින් ම පිරි පින්වත් පවුලක උත්පත්තිය ලදහ. එහෙත් නොබෝ කලකින් ම මේ සියලු සැප සම්පත්හි ඇති නිසරු බව වටහාගත් තරුණ බෝසතාණෝ එම සැප හැර දමා හිමාලයට ගොස් පැවිදි වූහ. ඉතා ඉක්මනින් ම

ධර්මාවබෝධය ලැබූ බෝසත් තවුසාණෝ අනෙක් තවුසනට ශාස්තෘවරයෙකු බවට පත්වූහ.

හිමාල වනයේ තවුස් දම් රැකි සෑම තාපසයකු හට කුටියක් විය. දිනෙක එක් තාපසතුමෙකු සිටින කුටියට සර්ප පැටියෙක් පැමිණියේ ය. එම සර්ප පැටවා අල්ලාගත් තාපසතුමා උණ බම්බුවක් ගෙන සර්පයා එය තුළ දමා ඇති දැඩි කිරීමට සිතූහ. සර්ප පැටියා ගැන කරුණාව පහළ කළ තාපසයා නිසි වේලාවට උණ බම්බුවෙන් එළියට ගෙන ආහාර ලබා දුනි. සර්පයා උණ බම්බුව තුළ වැඩෙන නිසා වෙළුක ලෙස ද හදා වඩා ගන්නා තාපසයනට වෙළුක තාපස යනුවෙන් මිනිසුන් අතර ප්‍රසිද්ධ විය.

වෙළුක තාපසයාණන් ගෙන්වා,

''කුඩා වුවත් විශාල වුවත් සර්පයාගේ විෂ එකම බව ඔබ නොදන්නෙහි ද'' යනුවෙන් ඇසූහ.

වෙළුක තාපස තෙමේ කිසිත් නොපවසා අසා සිටියේ ය. එවිට නැවතත් බෝසතාණෝ මෙම සර්පයා පැටවකු වුවත් විසකුරු නිසා උණ බටයෙන් ඉවතට ගෙන වනයට මුදහරින ලෙස උපදෙස් දුන්හ.

''ඇති දැඩි කළ මේ වේළුක සර්ප පැටියා විෂ වුවත් මා හට අත් හැරීමට නොහැකි යි'' පැවසූ වේළුක තාපසයා බෝසතාණන්ගේ අවවාදය නොපිළිගත්තේ ය.

ටික දිනකින් භාවනා යෝගී ව වැඩ වාසය කිරීමට ඉතා සුදුසු පරිසරයක් සොයා ගිය තාපසයා ගස් කොළන්, පලතුරු පිරි පෙදෙසකට වැඩම කළහ. වේළුක තාපසයන්

වේළුක සර්පයා පැටියා ගෙන යා නොහැකි බැවින්, පිටත් වූයේ කණගාටුවෙනි. දින ගණනාවක් භාවනා යෝගීව ගත කළ තාපසයන් ආපසු වැඩම කළ වහාම වේළුක තාපසයා කුටිය තුලට දිවූහ. උණ බටය හැර

''වේළුක දරුව, එළියට පැමිණ ආහාර ගන්න'' යයි පවසා තම අත උණ බටයට ළං කළහ. දින කීපයක් ම ආහාර නොමැතිව සිටි වේළුක පැටියා කේන්තියෙන් පසු වූයේ ය. එමනිසා තාපසයා අත දිගු කළ වහාම, සර්පයා අතට දෂ්ට කළේ ය. විෂ ශරීර ගත වූ නිසා වේළුක තැන එකෙණෙහිම මිය පරලොව ගියේ ය.

අප මහ බෝසතාණෝ තාපසවරුන් රැස් කරවා, වේළුක තාපසයනට වූ දේ පෙන්වූහ. අවවාද කළහ. කෙනෙකු කරදරයකට පත්වන විට, හෝ කරදයක වැටෙන්නට යන විට දැනමුතු අය අවවාද උපදෙස් දුන් විට ඒවා පිළිගත යුතු යි. නැත හොත් වේළුක තාපසයා මෙන් විනාශයට පත්වීම නියත බැව් බෝසතාණෝ වදාළහ.

එමනිසා අප කවුරුත් අවවාද, උපදෙස් අපගේ ජීවිතයනට වැදගත් බව සිතට ගනිමු.

මෙකල අවවාද නො අසන භික්ෂුව, වේළුක තාපසයා තැන බවත් බෝසත් ශාස්තෘන් වහන්සේ තමන් වහන්සේ බැව් බුදුරජාණන් වහන්සේ වදාළ සේක.



# මතු රැකෙනා සිල්පය මැ යි උගත මනා

උගන්නා කිසිවක් - වේ නම් උගනු එ හොඳින්
සිරිතුත් ලැබුණු දැනුමට - සරි වුව මනා බව දනු (391)

නියම නෙත් ඇත්තේ - සිප් සතර උගතුනට යැ
මුහුණේ සෙසු නරන් ගේ - පිහිටියේ වණ යුවළෙකි (393)

එක් අත් බවෙකැ ලත් - සතරේ දැනුම පිරිසුදු
සත් අත් බැවෙකැ සොම්නස - දනවා සුව මැ සපයයි (398)

දැන උගත් කම ලොවැ - දනයෙකි නැසියැ නො මැ හැකි
නියම සොම්නස දනවන - දනයෙක් අනෙක් නැති මැ යැ (400)

නොමඟ යෑමෙන් හා - පව් කැරැමින් ද සිත රැකැ
යහ වැඩෙහි ඒ යෙදුමත් - සැබැවින් නියම නුවණ යැ (422)

---

(තිරුවල්ලුවර් කවියා ගේ ''තිරුක්කුරළ්'' නම් දෙමළ නීති කාව්‍යයේ සිංහල අනුවාදය වන ''සිරිගීය'' නමැති කෘතියෙන් උපුටා ගැනිණ. අනුවාදය ශ්‍රී චාල්ස් ද සිල්වා සූරීන් ගෙනි)